ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහු වෙත ඔහුගේ පාවහන් පටියට වඩා සමීපයෙන් ස්වර්ගය පිහිටයි. එමෙන්ම අපා ගින්න ද පිහිටයි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: "ඔබ අතරින් කිසිවෙකු හෝ වේවා ඔහු වෙත ඔහුගේ පාවහන් පටියට වඩා සමීපයෙන් ස්වර්ගය පිහිටයි. එමෙන්ම අපා ගින්න ද පිහිටයි."
[صحيح] [رواه البخاري]

පාවහන් මතුපිටින් ඇති පටිය සමීපයෙන් පවතින්නාක් මෙන් සැබැවින්ම ස්වර්ගය හා නිරය මිනිසාට සමීපයෙන් පවතින බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දැනුම් දුන්හ. හේතුව සැබැවින්ම ඔහු සර්වබලධාරී අල්ලාහ්ට තෘප්තිමත් කටයුතු අතරින් අවනත වීමේ කටයුතු වල නිරත වෙයි. එමගින් ඔහු ස්වර්ගයට පිවිසෙයි. එසේ නැතහොත් ඔහු පාපයක් සිදු කරයි. එය නිරයට පිවසීමට හේතුවක් වේ.

http://sunnah.global/hadeeth/si/show/3581